## අඩු කාලයකින්, ලාභදායි, පරිසර හා සේවක හිතකාමී තවාන් පස් මිශ්‍රණය ධූමකරණ ක්‍රියාවලිය

| | රසායනික ද්‍රව්‍ය | බැසමිඩ් (Basamid) | මෙතම් සෝඩියම් (Metham sodium) |
|---|---|---|---|
| | පස් කියුබයකට අවශ්‍යතාවය | 250g | 800ml |
| | පස් තට්ටුවේ උපරිම උස | 20cm (අඟල් 08) | |
| | යෙදීම | කුඩු විසිරීම | බෝතලයෙන් |
| | පසට මිශ්‍රකිරීම | උදැල්ලකින් | |
| | තෙත් කිරීම | මල් බාල්දියකින් | |
| ධූමාකරණ ක්‍රියාවලිය | ආවරණය කිරීම * | ගේජ් 500 පොලිතීන් | |
| ධූමාකරණ ක්‍රියාවලිය | ආවරණය විවෘත කිරීම | 8 වන දිනයේදී | |
| අවශේෂ වායු ඉවත් කිරීම | පළමු මිශ්‍ර කිරීම | 9 වන දිනයේදී | |
| අවශේෂ වායු ඉවත් කිරීම | දෙවන මිශ්‍ර කිරීම | 12 වන දිනයේදී | |
| අවශේෂ වායු ඉවත් කිරීම | තෙවන මිශ්‍ර කිරීම | 15 වන දිනයේදී - මෙදිනම පස් ධූමකරණ ස්ථානයෙන් පිටතට ගෙන යා හැක. | |
| | පස් බෑග් කිරීම | 22 වන දිනයේ පටන් | |
| | පැළ සිටුවීම | 29 වන දිනයේ පටන් - ඔබගේ පහසුව පරිදි | |

*** අවශේෂ වායු ඉවත්වීම**

- අයහපත් වැසි කාලගුණ තත්ත්වයටතේදී,
- අධික ලෙස වතුර යෙදීම නිසා පසෙහි තෙතමනය වැඩිවීමෙන්,

අවහිර වන බැවින් මේ පිළිබඳ නිසි අවධානය යොමුකළ යුතුය.


**විමසීම්:**

- පැළෑටි සංරක්ෂණ සේවය, ගන්නොරුව
  081-2388316
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව
  081-2388011
- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ
  034-2261323
- කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, සීතාඑළිය
  052-2222615

**තාක්ෂණික තොරතුරු:**
එච්.පී. හරිත නිමලනන්ද, සහකාර සංවර්ධන අධ්‍යක්ෂ (සංවර්ධන)

**සැකසුම:**
ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**මුද්‍රණය:**
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව



ගොවිතැනට මුල්තැන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016-2018 FOOD FIRST


# පේර තවාන්වල වටපණු හානිය පාලනය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය 2017

වටපණු හානියක් හේතුවෙන් අනුරාධපුරය, පුත්තලම, හොරණ ඇතුළු දිවයිනේ බොහෝ ප්‍රදේශවල පේර වගාවන් දරුණු පසුබෑමකට ලක්වී ඇති බවත්, මෙම හානිය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බවත් හඳුනාගෙන ඇත. මෙම හානිය පැතිර යාමේ එක් ප්‍රධාන මාර්ගයක් වන්නේ තවාන් පැළ බව තහවුරු වී ඇත.

එබැවින් ක්ෂේත්‍රයේ ආර්ථික වශයෙන් ඵලදායී වගාවක් ස්ථාපනය කර ගැනීම සඳහා වටපණු හානියෙන් තොර නිරෝගී පැළයක් පාරිභෝගිකයා වෙත ලබාදීම තවාන් හිමියාගේ පරම යුතුකමයි.

වටපනු හානියෙන් තොර නිරෝගී, ශක්තිමත් පේර පැළයක් ලබාගැනීම සඳහා තවාන් කරුවන් විසින් පහත පියවර අනුගමනය කළ යුතුය.

## තවානක් සඳහා භූමිය තෝරාගැනීම

හොඳින් හිරුඑළිය පවතින, ජල වහනය හොඳින් සිදුවන තවාන් පස් පහසුවෙන් ලබාගත හැකි, පහසුවෙන් ළඟාවිය හැකි හා විශේෂයෙන්ම වටපණු හානිය පිළිබඳ ඉතිහාසයක් නොමැති භූමියක් තවාන සඳහා තෝරාගත යුතුයි.

භූමියේ පස් වටපණුවන් සඳහා පරීක්ෂාකර ගැනීම ඉතා වැදගත්ය. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ලබාගත හැක.

## පැළ බඳුන් ඇසිරීම සඳහා පාත්ති සකස්කර ගැනීම

ජල වහනය දියුණු කිරීමටත්, වටපණු ආසාදනය අවම කිරීමටත් අඟල් 8 ක් (සෙන්ටිමීටර් 20 ක්) පමණට උස්වූ පාත්ති සැකසිය යුතු අතර, එම පාත්ති මත ඝණකම පොලිතීන් ආවරණයක් යොදා එම ආවරණය මත පැළ බඳුන් ඇසිරීම කළ යුතුයි. නැතිනම් අඟල් 2 ක් ඝණකම වැලි තට්ටුවක් පාත්තිය මත අතුරා ඒ මත පැළ බඳුන් ඇසිරීමද කළහැක.

## මූලිකව පේර බීජ පැළකර ගැනීම සඳහා පස ධූමකරණය

මේ සඳහා තවාන් පස ධූමකරණය කිරීම ඉතා වැදගත්ය. පොලිතීන් අතුරණයක් එලා ඒ මතට උපරිම අඟල් 8 ක් ඝණකමට ධූමකරණය කලයුතු පස අතුරන්න. පස් වර්ග මීටරයකට බැසමිඩ් (Basamid) 98% කැට ග්‍රෑම් 10 ක් විසුරුවා අත් මුල්ලුවක් ආධාරයෙන් පස් සමඟ මිශ්‍ර කරන්න. ජලයෙන් තෙත් කර වසුනක් යොදා අවම වශයෙන් සති 2 ක් පමණ කාලයක් තබන්න.

පසුව වසුන ඉවත්කර පස පෙරලා බැසමිඩ් ගඳ නැතිවන තුරු තබා මෙම පස් බන්දේසි වල දමා හෝ සැකසූ පාත්ති මතම පේර බීජ විසුරුවා හැරිය හැක. (සාමාන්‍යයෙන් දින 29 කට පසු)

සැලකිය යුතුයි:
බීජ විසිරීමට පෙර අබ ඇට විසුරුවා පැළවේ දැයි පරීක්ෂාකර බලන්න.

## බඳුන් මිශ්‍රණය ධූමකරණය

පළමුව පස්, කොම්පෝස්ට්, වැලි යොදා තවාන් මිශ්‍රණය සකසා ගන්න. ඉන්පසුව ධූමකරණය කිරීම අනිවාර්යය වේ. මේ සඳහා බැසමිඩ් හා මෙතම් සෝඩියම් යන ධූමකාරක නිර්දේශ කෙරේ. එම ක්‍රියාවලිය සැකෙවින් පසු පිටෙහි විස්තර කෙරේ.

## ජලය සම්පාදනය

ජල ප්‍රවාහයෙන් නොකඩවා ජලය ලබා ගැනීමේ පහසුව තිබිය යුතු අතර, කෘෂි කාර්මික ඉඩම් හරහා ජලය ගලාගෙන යාමේදී වටපණු ආසාධනයට ලක්වීමට ඉඩ ඇති බැවින් එම ජලයට බ්ලීචින් කුඩු ග්‍රෑම් 01 ක් ජලය ලීටර් 100 ක දියකර පැය 12 කට පසු තවානට යෙදීම සුදුසුවේ.